# ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ශ්‍රී ලංකා ආර්ථිකය

ජේ.එච්.එම්.කේ.බී. ජයපත්ම[1]

**සංක්ෂේපය**

ජාත්‍යන්තර ආර්ථික කටයුතු පිළිබඳ සාකච්ඡා කිරීමේ දී නිතැතින් ම මුවට නැගෙන මාතෘකාවක් ලෙස බහු පාර්ශවීය මූල්‍ය ආයතන හැඳින්විය හැකි ය. ඒ අතරින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රධාන තැනක් ගනියි. වර්තමානයේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දායකත්වය හා බලපෑම ඉතාමත් ඉහළ මට්ටමක පවතින බව පෙනී යන කරුණකි. මෙවන් පසුබිමක් තුළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා එහි ක්‍රියාකාරීත්වය මෙන් ම වර්තමානය වන විට ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග පවත්නා සම්බන්ධතාවයේ ස්වරූපය පිළිබඳව ද අවබෝධයක් තිබීම සජීවී ආර්ථික ගවේෂකයෙකුට වැදගත් සාධකයකි. 1952 දී ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සාමාජිකත්වය ලබා ගැනීමත් සමග ආර්ථිකය තුළ විවිධ අවස්ථාවන්වල දී හට ගත් මූල්‍යමය ගැටළු විසඳා ගැනීම පිණිස ඉන් ලැබුණු දායකත්වය ප්‍රශංසනීය වේ. විශේෂයෙන්ම එහිලා ලබා ගත් ණය හා අරමුදල් ශ්‍රී ලංකා ආර්ථිකය බිඳ නොවැටී ඉදිරියට ගෙන ඒමට මහත් රුකුලක් විය. සමීපස්ථ ණය සැපයුම, දීර්ඝ කරන ලද විස්තීර්ණ අරමුදල් පහසුකම, හානි පූරණ ණය පහසුකම, ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම්, ආපදා ආධාර ආදී විවිධ ණය හා අරමුදල් මේ සඳහා උදාහරණ වශයෙන් ඉදිරිපත් කළ හැකි ය. විශේෂයෙන් ම ණය අරමුදල් සැපයීමට අමතරව ගෙවුම් ශේෂ ගැටළු අවම කරලීම උදෙසා අවශ්‍ය උපදෙස් හා විධිවිධාන සැපයීම ද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් සිදු කරන ප්‍රධානතම කාර්ය භාරයක් වශයෙන් හඳුනා ගත හැකි ය. ඒ අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා එහි ක්‍රියාකාරීවය මෙන් ම ඒ සම්බන්ධ වැදගත් අංශ ඔස්සේ ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳ විමසීමක් මේ මඟින් සිදු කරයි.

**මුඛ්‍ය පදඃ** බහු පාර්ශවීය මූල්‍ය ආයතන, සමීපස්ථ ණය සැපයුම, ව්‍යුහාත්මක ගැලපුම්, ගෙවුම් ශේෂ ගැටළු

**හැඳින්වීම**

1930 දී ඇති වූ මහා ආර්ථික පරිහානියත්, දෙවන ලෝක යුද්ධයේ බලපෑමත් සමග ලෝක ආර්ථිකයේ දැඩි බිඳ වැටීමක් දක්නට ලැබුණි. මෙවැනි තත්ත්වයක් යටතේ ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව ශක්තිමත් කර අන්තර්ජාතික වෙළෙඳාමේ වර්ධනයක් හා විනිමය අනුපාතිකයන්හි ක්‍රමවත්භාවයක් ඇති කරලීමේ වැදගත්කමත් බොහෝ රටවල් විසින් අවබෝධ කර ගත් සාධකයක් විය. මෙවන් පසුබිමක් තුළ බොහෝ රටවල් නැවත රන් මිනුම් ක්‍රමය මඟින් මෙම තත්ත්වය සමනය කිරීමට උත්සාහ දරන ලදී. නමුත් එය අසාර්ථක ප්‍රයත්නයක් වූ අතර, මෙහි

[1]ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථික විද්‍යා දෙවන වසර,kosalabjayapathma3319@gmail.com

ප්‍රතිඵලයක් වශයෙන් 1944 ජුලි මස බ්‍රිට්න් වුඩ්ස් ගිවිසුම අත්සන් කිරීම සිදු කරන ලදී. එහි අවසාන ප්‍රතිඵලයක් වශයෙන් 1945 දෙසැම්බර් මස 27 වන දින රටවල් 44 ක සාමාජිකත්වයෙන් යුක්තව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පිහිටු වන ලදී. වර්තමානය වන විට එහි සාමාජිකයන් 186 කි. ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව, විනිමය අනුපාතිකයන් ස්ථාවරව පවත්වා ගැනීම හා ඒවායේ විධිමත්භාවය ප්‍රවර්ධනය කිරීමටත්, ආර්ථික වෘද්ධිය හා සේවා නියුක්තිය ඉහළ නැංවීම හා ගෙවුම් ශේෂ ගැටළු මග හරවා ගැනීමට ආයතනිකමය යාන්ත්‍රණයක් සැපයීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පිහිටු වීමේ ප්‍රධාන අභිලාෂයන් විය. කෙසේ වුව ද වර්තමානය වන විට ජාත්‍යන්තර වශයෙන් සිය සාමාජික රටවල්වල ගෙවුම් ශේෂ හා විනිමය අනුපාත සම්බන්ධ ගැටළු විසඳීම සඳහා අවශ්‍ය ණය හා අරමුදල් මෙන් ම උපදේශනයන් සැපයීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සිදු කරනු දැක ගත හැකි ය.

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි අරමුණු හා පරමාර්ථ**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි අරමුණු හා පරමාර්ථ කිහිපයක් ප්‍රධාන වශයෙන් පහත පරිදි හඳුනා ගත හැකි ය.

1. ජාත්‍යන්තර මූල්‍ය ප්‍රශ්නවලදී උපදේශකත්වය හා සහයෝගීතාව සඳහා යාන්ත්‍රණයක් සැපයෙන සථිරසාර ආයතයක් ඔස්සේ ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම.

2. විනිමය ස්ථායීතාවය දියුණු කිරීම, සාමාජිකයන් අතර විධිමත් විනිමය සම්මුති පවත්වාගෙන යාම හා තරඟකාරී ලෙස විනිමය අවප්‍රමාණය වැළැක්වීම.

3. ජාත්‍යන්තර වෙළෙඳාමේ ප්‍රසාරණය හා තුලිත වර්ධනය සඳහා පහසුකම් සැපයීම හා ඒ තුළින් ආර්ථික ප්‍රතිපත්තියෙහි මූලික අභිලාෂයන් ලෙස සියළු සාමාජික රටවල ඵලදායී සම්පත් සංවර්ධනය හා සේවා නියුක්තිය හා මූර්ත ආදායම් ඉහළ නැංවීම උදෙසා දායක වීම.

4. සාමාජික රටවල ගෙවුම් ශේෂ අසමතුලිතතාවල තීව්‍රතාව හා ඒවා පවත්නා කාල සීමාව කෙටි කිරීම.

5. සාමාජික රටවල් අතර ජංගම ගනුදෙනු සඳහා බහු පාර්ශවීය ගෙවුම් ක්‍රමයක් පිහිටු වීම හා ලෝක වෙළෙඳාමේ වර්ධනයට බාධාකාරී විදේශ විනිමය සීමා ඉවත් කිරීම සඳහා උපකාර කිරීම.

ඉහත අරමුණ ඔස්සේ කටයුතු කිරීම තුළින් හැකිතාක් පහසුවෙන් ගෝලීය ආර්ථිකය පවත්වා ගෙන යාමටත්, රටවල් මූල්‍යමය අර්බුදවලින් වළක්වා ගැනීමටත්, සාමාජික රටවලට උදව් කිරීමත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සිදු කරනු ලබයි. එහිලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ඒ සඳහා අවශ්‍ය අරමුදල් සහ සම්පත් ලබා ගන්නේ ද සාමාජික රටවල් විසින්ම දායක වන අරමුදල්වලිනි. සාමාජික රටෙහි ආර්ථික ශක්‍යතාව මත එක් එක් රටෙන් දායක කර ගත යුතු අරමුදල් ප්‍රමාණය තීරණය කෙරෙයි. ඒ අනුව එක් එක් සාමාජික රටෙහි දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම, වර්තන ගිණුමේ තත්ත්වය හා නිල විදේශ සංචිත ප්‍රමාණය ආදී සාධක

සැලකිල්ලට ගනී. කෙසේ වෙතත් වර්තමානයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩිම දායකත්වයක් ලබා ගෙන ඇත්තේ ඇමරිකා එක්සත් ජනපදයයි. එය විශේෂ ගැනුම් හිමිකම් (SDR) රු. මිලියන 37500 ඉක්මවයි.

### විශේෂ ගැනුම් හිමිකම් (SDR)

විශේෂ ගැනුම් හිමිකම් වශයෙන් හඳුන්වනු ලබන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නිර්මාණය කරන ලද සංචිත වත්කමකි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සියළු ගනුදෙනු සිදුවන්නේ මෙම විශේෂ ගැනුම් හිමිකම් පදනම් කර ගනිමිනි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් මෙම වත්කම් විශේෂය හඳුන්වා දෙනු ලැබුවේ ජාත්‍යන්තර ද්‍රවශීලතා සැපයුමේ නම්‍යතාවක් ඇති කරවමින් විනිමය අනුපාතිකයන්හි ස්ථාවරත්වයක් ඇති කිරීමේ අරමුණිනි. එවකට පැවති රන් හා ඇමරිකානු ඩොලර් ජාත්‍යන්තර ද්‍රවශීලතා මාධ්‍යයක් වශයෙන් එතරම් කාර්යක්ෂම නොවීම මේ සඳහා හේතු පාදක විය. ඒ අනුව විශේෂ ගැනුම් හිමිකම් වශයෙන් හඳුන්වන්නේ මෙම ජාත්‍යන්තර සංචිත මාධ්‍යයයි. මේවා කිසියම් ව්‍යවහාර මුදල් වර්ගයක් නොවන අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජික රටවල ව්‍යවහාර මුදල් වෙනුවට හුවමාරු කර ගත හැකි ද්‍රවශීලතා මාධ්‍යයකි. ආරම්භයේ දී විශේෂ ගැනුම් හිමිකම් ඒකකයක වටිනාකම ඇමරිකානු ඩොලරයට සමාන වන පරිදි තීරණය කළ ද පසුකාලීනව ඩොලරයේ අගය උච්ඡාවචනය වීම හේතුවෙන් ප්‍රධාන මුදල් වර්ග කිහිපයක බර තබන ලද මධ්‍යන්‍ය අගයකට අනුව ගණනය කරනු ලබයි. ඒ අනුව වර්තමානයේ දී ඇමරිකානු ඩොලරය, යූරෝ මුදල් ඒකකය, ජපන් යෙන් හා බ්‍රිතාන්‍ය පවුම් යන මුදල් ඒකකයන්ගේ බර තබන ලද අගය මත අදාළ ගණනය කිරීම් සිදු කරයි.

### ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ණය පහසුකම්

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධාන වගකීමක් වන්නේ ගෙවුම් ශේෂ ගැටළුවලට මුහුණ දෙන සාමාජික රටවලට ණය පහසුකම් සපයා දීමයි. ඒ අනුව ගෙවුම් ශේෂයේ හිඟයක් පියවීමට අවශ්‍ය මූල්‍ය සම්පත් සපයා ගත නොහැකි ඕනෑම සාමාජික රටකට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ආධාර ඉල්ලා සිටිය හැකිය. එසේ ණය ලබා දීමේ දී සලකා බලනු ලබන කොන්දේසි කිහිපයකි. ඒ අනුව වසරක කාල සීමාවක් තුළ සලකා බලන මුදල් වර්ගයෙන් අරමුදල වෙත ඇති සංචිත ප්‍රමාණය සියයට 25 ක ප්‍රමාණයට වඩා වැඩියෙන් ඉහළ නොයන්නේ නම් අදාළ රටට ණය ලබා ගැනීමට හැකි ය. ඒ හැරුණු කොට අදාළ රටෙහි සාමාජික කොටසේ ඇති විශේෂ ගැනුම් හිමිකම් ප්‍රමාණය මෙන් දෙගුණයක් දක්වා ණය ලබා ගත හැකි ය. ඒ අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ලබා දෙන මූල්‍ය පහසුකම් සහනදායී හා සහනදායී නොවන ලෙස කොටස් දෙකකට වර්ග කළ හැකි ය.

සහනදායී ණය පහසුකම් ලබා ගැනීමේ හැකියාව පවතින්නේ අඩු ආදායම්ලාභී රටවලට ය. ලෝක බැංකු වර්ගීකරණය අනුව වාර්ෂික ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම ඇමරිකානු ඩොලර් 975 ට අඩු රටවල් අඩු ආදායම්ලාභී රටවල් යටතට ගැනේ. 2010 ජනවාරි මස සිට අඩු ආදායම් ලබන රටවල් සඳහා මූල්‍ය පහසුකම් සැපයීම පිණිස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් විශේෂ වැඩ පිළිවෙළක් හඳුන්වා දෙන ලදී. එය

දිළිඳුකම අඩු කිරීම හා ආර්ථික වෘද්ධිය සඳහා වන සංචිතය වශයෙන් හඳුන්වනු ලබයි. මේ යටතේ ප්‍රධාන මූල්‍ය පහසුකම් තුනක් අඩු ආදායම්ලාභී රටවලට හඳුන්වා දී තිබේ. ඒවා නම්,

1. දීර්ඝ කරන ලද ණය පහසුකම (Extended Credit Facility - ECF)
2. සමීපස්ථ ණය පහසුකම (Stand-by Credit Facility – SCF)
3. ශීඝ්‍ර ණය පහසුකම (Rapid Credit Facility – RCF) වේ.

අනෙක් අතට පොලියක් අය කරමින් මධ්‍ය හා ඉහළ ආදායම්ලාභී රටවලට සහනදායී නොවන මූල්‍ය පහසුකම් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සපයනු ලබයි. මේ සඳහා යොදා ගැනෙන ප්‍රධාන ණය සැපයුම් මූලාශ්‍ර කිහිපයකි. ඒවා නම්,

1. සමීපස්ථ විධිවිධාන (Stand-by Arrangements – SBA)
2. නම්‍යශීලී ණය සැපයුම (Flexible Credit Line – FCL)
3. දීර්ඝ කරන ලද අරමුදල් පහසුකම (Extended Fund Facility – EFF)
4. හදිසි ආධාර පහසුකම (Emergency Assistance Facility – EAF)

වේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් මෙම කුමන ක්‍රමයකට වුව ද ණය ලබා ගැනීමේ දී ඒ ඒ ක්‍රමවේදයන්ට අදාළ වන්නා වූ කොන්දේසි හා නියමයන්ට එකඟ වීමට සාමාජික රටවල්වලට සිදු වේ.

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ශ්‍රී ලංකා ආර්ථිකය**

ශ්‍රී ලංකාව 1952 ජනවාරි 17 වන දින ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජිකත්වය ලබා ගත් අතර ඇමරිකානු ඩොලර් දශ ලක්ෂ 45 ක ආරම්භක සංචිත ප්‍රමාණයකින් (වි.ගැ.හි SDR) ඒ සඳහා දායක වී තිබේ. ඒ අනුව 1960 න් පසු ශ්‍රී ලංකාව ගෙවුම් ශේෂ හිඟයන්ට මුහුණ දුන් අවස්ථාවන්වල දී එය පියවා ගැනීම පිණිස ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මූල්‍ය පහසුකම් ප්‍රයෝජනයට ගෙන තිබේ. විශේෂයෙන් ම 1977 හඳුන්වා දුන් විවෘත ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් විශාල අනුග්‍රහයක් ලැබුණි. ශ්‍රී ලංකාව ප්‍රථම වරට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ණය ලබා ගනු ලැබුවේ 1977 වර්ෂයේදීය. එය ඇමරිකානු ඩොලර් මිලියන 133.6 ක සමස්ත ණය පහසුකමකි. ඉන් පසුව 1979, 1980, 1981, 1982, 1983, 1988, 1989 යන වර්ෂවලදී ද ණය මුදල් ලබා ගන්නා ලදී. 1981 වර්ෂය මේ අතරින් වැඩිම ණය ප්‍රමාණයක් ලබා ගත් වර්ෂය වේ. ඒ අනුව 1977 සිට මේ දක්වා ශ්‍රී ලංකාව විසින් විවිධ අවස්ථාවන්හි දී විවිධ ණය පහසුකම් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් ලබා ගෙන තිබේ. 1977 සිට මේ දක්වා එසේ ලබා ගත් විවිධ ණය පහසුකම් හා ඒ පිළිබඳ සාරාංශ සටහනක් පහත වගුව මඟින් දැක්වේ.

1.1 වගුව: ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබා ගත් ණය පහසුකම් (1977-2010)

| වර්ෂය | ණය පහසුකම | අනුමත කළ ණය ප්‍රමාණය (වි.ගැ.හි මිලියන) | ලබා ගත් ප්‍රමාණය (වි.ගැ.හි මිලියන) |
|---|---|---|---|
| 1977 | *සමීපස්ථ විධිවිධාන (ණය සැපයුම)* | - | 133.6 |
| 1979 | *දීර්ඝ කරන ලද අරමුදල් පහසුකම* | - | 29.7 |
| 1980 | *දීර්ඝ කරන ලද(විස්තීර්ණ) අරමුදල් පහසුකම* | - | 55.1 |
| 1981 | *හානි පූරණ ණය පහසුකම සහ දීර්ඝ කරන ලද අරමුදල් පහසුකම* | - | 176.0 |
| 1982 | *හානි පූරණ ණය පහසුකම* | - | 39.2 |
| 1983 | *ආරක්ෂණ තොග මූල්‍යකරණ පහසුකම* | - | 35.8 |
| 1983 | *සමීපස්ථ විධිවිධාන (ණය පහසුකම)* | 100.0 | 50.0 |
| 1988 | *හානි පූරණ මූල්‍ය පහසුකම සහ ව්‍යුහාත්මක ගැළපුම් පහසුකම්* | - | 153.4 |
| 1989 | *ව්‍යුහාත්මක ගැළපුම් පහසුකම්* | 156.2 | 156.2 |
| 1991 | *දිළිඳුකම අඩු කිරීම සහ ආර්ථික වෘද්ධිය සඳහා පහසුකම* | 336.0 | 280.0 |
| 2001 | *සමීපස්ථ විධිවිධාන (ණය සැපයුම)* | 200.0 | 200.0 |
| 2003 | *දිළිඳුකම අඩු කිරීම සහ ආර්ථික වෘද්ධිය සඳහා පහසුකම* | 269.0 | 38.4 |
| 2003 | *දීර්ඝ කරන ලද(විස්තීර්ණ) අරමුදල් පහසුකම* | 144.4 | 20,7 |
| 2005 | *ආපදා ආධාර (සුනාමි)* | 103.4 | 103.4 |
| 2009 | *සමීපස්ථ විධිවිධාන (ණය පහසුකම)* | *1653.6 | 826.8 |
| 2016 | *දීර්ඝ කරන ලද(විස්තීර්ණ) අරමුදල් පහසුකම* | 119.9 | - |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව,*

ශ්‍රී ලංකාව විසින් වරින් වර මෙසේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය පහසුකම් ගත් අතර අවසන් වරට ණය ලබා ගන්නා ලද්දේ 2009 වර්ෂයේදී ය. එහි දී අදියර තුනක් යටතේ එකී ණය ගැනීම සිදු විය. පසුගිය කාල වකවානුව ගත් කල රටේ නිල විදේශ සංචිත ප්‍රමාණයේ දැඩි පහළ යාමක් දැක ගත හැකි විය. ඊට හේතුව

වූයේ මහ බැංකුව විසින් රුපියල අවප්‍රමාණය වීම වැළැක්වීම සඳහා විදේශ සංචිත යොදා ගනිමින් දේශීය රුපියලෙහි අගය ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීමයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස රටෙහි පැවති විදේශ සංචිත ප්‍රමාණය සීඝ්‍රයෙන් අඩු වූ අතර, එය මූල්‍යනය කර ගැනීම පිණිස ඇමරිකානු ඩොලර් බිලියන 1.9 ක පමණ සමීපස්ථ ණය මුදලක් ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඉල්ලුම් කරන ලදී. ඒ අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිත කණ්ඩායම් දෙකක් විසින් මෙකී ඉල්ලීම සලකා බලන ලදී. සාමාන්‍යයෙන් සමීපස්ථ ණය සපයනු ලබන්නේ හදිසි ගෙවුම්ශේෂ ගැටලු පියවීමට පමණි. අනෙක් අවශ්‍යතාවන් සඳහා එම ණය පහසුකම් භාවිත කිරීම තහනම්ය. අනෙක් අතට මෙම ණය මාස පහක් වැනි කෙටි කාල සීමාවක් තුළ ගෙවා නිම කළ යුතු ය. එසේ ම ඒ සඳහා සියයට 4 ත් 5 ත් අතර ප්‍රමාණයක පොළියක් ගෙවිය යුතු වේ. ඒ අනුව මෙම තත්ත්වය මතභේදයකට තුඩු දුන් සාධකයක් විය. කෙසේ වුව ද අවසානයේ දී ගෙවුම් ශේෂ තුලනයට සහයෝගයක් වශයෙන් 2009 ජුනි 24 දින මෙම ණය ප්‍රමාණය අනුමත කරන ලදී. එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ශ්‍රී ලංකාවට සපයන ලද විශාලතම ණය ප්‍රමාණය විය. අදියර තුනක් යටතේ මෙම ණය ලබා දීම සිදු වූ අතර, එහි පළමු වාරිකය වශයෙන් ඇ.ඩො දශ ලක්ෂ 322 ක් හිමි විය. මෙසේ ලබා ගත් සමීපස්ථ ණය පහසුකම මඟින් සිදු කිරීමට ඉලක්කගත කරන ලද ප්‍රතිපත්ති හා අරමුණු කිහියක් විය. ඒවා නම්,

1. 2009 වර්ෂයේ අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට හතක මට්ටමේ පවත්වා ගැනීම,

2. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව හා එමඟින් ගැටුම්වලින් පීඩාවට පත් වූ ප්‍රදේශ නගා සිටුවීම, නැවත පදිංචි කරවීම හා යළි ගොඩ නැඟීම සඳහා වන වියදම් වෙනුවෙන් ඉඩ සැලසීම,

3. මෙකී ප්‍රතිපත්ති හරහා ශ්‍රී ලංකාව කෙරෙහි ආයෝජකයින්ගේ විශ්වාසය වැඩි දියුණු කර ගැනීම හා ඒ තුළින් ද්වි පාර්ශවීය සහ බහු පාර්ශවීය මූල්‍ය ආයතන මඟින් ණය මුදල් ආකර්ෂණය කර ගැනීම,

4. සංචිත වර්ධනය,

5. දැරිය හැකි මට්ටමකට අයවැය හිඟය අඩු කිරීම,

6. මූල්‍ය අංශය ශක්තිමත් කිරීම,

7. දිළිඳු පුද්ගලයන්ට ණය හා ආධාර සැපයීම, ආදිය වේ.

මෙම ණය ලබා දීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ලබාදීමේ මෙහෙයුම් ප්‍රධානී බ්‍රයන් අයිට්කින් (Brian Aitken) මහතා ප්‍රකාශ කර සිටියේ ශ්‍රී ලංකාව වසර ගණනාවක් පුරා විශාල අයවැය හිඟයක් පවත්වාගෙන යමින් එය කෙටි කාලීන ණය මුදල් මඟින් මූල්‍යනය කර ගත්තද ගෝලීය අරමුදල් ජාත්‍යන්තර වෙළඳපොළෙන් ලබා ගත නොහැකි වී ඇති බවයි. එනිසා විනිමය අනුපාතය අවප්‍රමාණය වීම මත විදේශ සංචිත පහළ යාම හරහා පීඩනයක් එල්ලව ඇති බැවින්

එය වැළැක්වීමට මැදිහත් වීමක් වශයෙන් ශ්‍රී ලංකාවට මෙම ණය පහසුකම ලබා දීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එකඟ වූ බවයි. කෙසේ වෙතත් මෙම ණය මුදල ලබා ගැනීමේ ප්‍රධාන අපේක්ෂාව වී ඇත්තේ අයවැය හිඟය දැරිය හැකි මට්ටමකට අඩු කිරීමයි. ඒ සඳහා බදු පදනමේ සංශෝධනයන් ඇති කරමින් අධිභාරය වැඩි කර ගැනීමට 2010 අයවැය මඟින් පියවර ගෙන තිබුණි. ලබා ගත් ණය සෘජුවම මහ බැංකුවේ සංචිතවලට යොමු කෙරුණු අතර එමඟින් නම්‍ය විනිමය අනුපාතය යොදා ගනිමින් විදේශ සංචිත නැවත ලබා ගැනීමට අපේක්ෂා කරන ලදී. මේ තුළින් ආර්ථික කම්පනයන් දරා ගනිමින් ගෙවුම් ශේෂ අර්බුදයන් විසඳා ගැනීමටත් ආයෝජකයන්ගේ විශ්වාසය ඉහළ නංවා ගනිමින් ආර්ථික වෘද්ධිය වේගවත් කර ගැනීමටත් රජය බලාපොරොත්තු විය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ගැනීමේ දී ප්‍රධාන වශයෙන් සිදු වන්නේ රටේ විදේශ සංචිත ප්‍රමාණය ඉහළ යාමයි. විදේශ ආයොජන, විදේශ ණය හා ආධාර, විදේශ ප්‍රදාන ගලා ඒම මගින් රටේ සංචිත වත්කම් ප්‍රමාණය ඉහළ යාම පිරිහෙමින් පවතින විනිමය අනුපාතයන් ශක්තිමත් කිරීමට හේතු වේ. ඒ හරහා රුපියලෙහි බාහිර අගය ශක්තිමත් වේ. රුපියලේ බාහිර අගය ශක්තිමත් වීම යනු දේශීය මුදල් ඒකකයකින් මිල දී ගත හැකි විදේශීය මුදල් ප්‍රමාණය අනුව මෙරට මුදල් ඒකකයකට ඇති වටිනාකම ඉහළ යාමයි. එහි ප්‍රතිඵලයක් ලෙස රුපියල ජාත්‍යන්තර පිළිගැනීමට ලක් වේ. මේ තුළින් ආනයන ශක්‍යතාව ඉහළ යන අතර ම ආර්ථිකයේ විදේශ වියදම් ගෙවීමේ හැකියාව ඉහළ යයි. ඒ අනුව ණය ශ්‍රේණිගත කිරීම් යහපත් වන අතර එය සෘජු විදේශ ආයොජන හා කොටස් වෙළෙඳපොළ ආයෝජන ඉහළ නැංවීමට හේතු විය හැකි ය.

2009 දී ශ්‍රී ලංකාව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ලබා ගැනීමේ ප්‍රධාන කොන්දේසියක් වූයේ අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට හතක මට්ටමේ පවත්වා ගැනීමයි. ඒ සඳහා රජයට විශාල වශයෙන් තම වියදම් කළමනාකරණය කිරීමට සිදුවේ. එසේ නැතිනම් වර්තන වියදම් සැලකිය යුතු ප්‍රමාණයකින් කපා හැරීම කළ යුතු ය. එසේත් නැතිනම් රාජ්‍ය ආදායම සැලකිය යුතු මට්ටමකින් ඉහළ නංවා ගත යුතු ය. නමුත් පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම දෙස බලන විට එය අපේක්ෂිත මට්ටමට ළඟා වූ බවක් පෙනෙන්නට නැත. අපනයන ඉහළ ගොස් ආනයනයන් වැඩි වීමේ උපනතියක් නොමැති අතර දිගින් දිගටම ආනයන වියදම් ඉහළ යන තත්ත්වයක් දැකගත හැකිය. ආදායම වැඩි කර ගැනීමේ අරමුණින් රජයට බදු ගෙවන මාර්ගවලින් ආදායම් ඉහළ නංවා ගැනීමට එකඟ වී ඇති අතර, ඒ සඳහා රාජ්‍ය ව්‍යවසායන්ගෙන් ලාභ ලබා ගැනීමත් ගාස්තු හා අයකිරීම් වැඩි කිරීමටත් තීරණය කර ඇත. මෙම අරමුණ ඉටු කර ගැනීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසියක් වී තිබෙන්නේ දැනට පාඩු ලබමින් සිටින විදුලි බල මණ්ඩලය හා ඛනිජ තෙල් සංස්ථාව පාඩු නොලබන තත්වයට පත් කිරීමයි. එනම් එවා පෞද්ගලීකරණ කළ යුතු බවයි. නමුත් ප්‍රායෝගිකව එය අපහසු කාර්යයක් බවට පත්ව ඇත.

මෙසේ ආදායම වැඩි කර ගත නොහැකි නම් ගත හැකි අනෙක් ක්‍රියා මාර්ගය වන්නේ වියදම් සීමා කිරීමයි. නැතිනම් වියදම් කපා හැරීමයි. එහෙත් රජයේ වියදම්

කපා හැරීම ද මේ වන විට යම් ගැටළු සහගත තත්ත්වයකට පත්ව ඇත. විශේෂයෙන් ම පසුගිය යුද කාලීන හා පශ්චාත් යුද කාලීන පිරිවැය තවමත් දරමින් සිටීම ඒ සඳහා ප්‍රබල බාධකයකි. කෙසේ වෙතත් 2010 අයවැය ලේඛනය සකස් කිරීමේ දී ප්‍රාග්ධන වියදම් කපා හැරීමට තීරණය කිරීමත් සමඟ ආයෝජන පහළ යාමේ නැඹුරුවක් ඇති විය. වර්තමානය වන විට ද එහි ප්‍රතිඵලයක් වශයෙන් ආයෝජනයන්හි පහළ යාමක් දක්නට ලැබේ.

කෙසේ වෙතත් මේ වන විට නැවතත් රටේ විදේශීය සංචිතවල සීඝ්‍ර පහළ යාමක් දක්නට ලැබේ. එමෙන් ම ලබා ගෙන ඇති අති විශාල ණය නැවත ගෙවීමට සිදුව තිබීමත් විනිමය අනුපාතයන් පිරිහීම නිසා දේශීය මුදලේ විදේශීය අගය අඩු වීමත් සිදුව තිබේ. මෙම හේතුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකය මේ වන විට දැඩි මූල්‍ය අස්ථාවරත්වයකට මුහුණ දී ඇත. මෙ තත්වයෙන් මිදීම පිණිස රජය විසින් නැවතත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇමරිකානු ඩොලර් බිලියන 1.5 ක ණයක් ලබා ගැනීමට එකඟතාවයකට පැමිණ තිබේ. පිරිහී ඇති විදේශීය සංචිත ප්‍රමාණය නැවත ඉහළ නැංවීම අරමුණු කරගෙන අදාළ ණය ඉල්ලුම් කර ගෙන ඇති අතර ඒ පිළිබඳ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක කමිටු අනුමැතිය ලබා ගැනීම සඳහා මේ වන විට සාකච්ඡා කෙරෙමින් පවතී.

**සමාලෝචනය**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රධාන වශයෙන් ම සිය සාමාජික රටවල්වල ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව, විනිමය අනුපාතිකයන් ස්ථාවරව පවත්වා ගැනීම හා ඒවායේ විධිමත්භාවය ප්‍රවර්ධනය කිරීමටත්, ආර්ථික වෘද්ධිය හා සේවා නියුක්තිය ඉහළ නැංවීම හා ගෙවුම් ශේෂ ගැටළු මඟ හරවා ගැනීමට ආයතනිකමය යාන්ත්‍රණයක් සැපයීමත් සිදු කරන ආයතනයකි. ඒ අනුව එවැනි අවශ්‍යතා සහිත සාමාජික රටවලට විවිධ ණය අරමුදල් මෙන් ම අවශ්‍ය උපදෙස් හා විධි විධානයන් සැපයීම එමඟින් සිදු කරයි. ශ්‍රී ලංකාව ද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජිකයෙකු වශයෙන් මෙම ප්‍රතිලාභ භුක්ති විඳිමින් සිටී. මේ මඟින් ප්‍රධාන වශයෙන් ම අවධානය යොමු කරන ලද්දේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යනු කුමක්ද යන්නත් එහි අරමුණු හා ක්‍රියාකාරීත්වය ඇසුරින් ඒ පිළිබඳ යම් අවබෝධයක් ලබා ගැනීමත් ය. එහිදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා සම්බන්ධ වැදගත් සංකල්පයන් හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ශ්‍රී ලංකා ආර්ථිකය අතර පවත්නා සම්බන්ධතාව මෙන් ම එමඟින් ආර්ථිකයට සිදුවන බලපෑම මෙන් ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ශ්‍රී ලංකා ආර්ථිකය සම්බන්ධ නවතම තත්ත්වය පිළිබඳව ද ප්‍රමාණාත්මක විස්තරයක් සිදු කරයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**

අතපත්තු ඩැනී, (2011), "ආර්ථික විද්‍යා ප්‍රවේශය 2", තරංජී ප්‍රින්ට්ස්, මහරගම.

හෙට්ටිආරච්චි උපාලි, (2000), "ජාත්‍යන්තර ආර්ථික විද්‍යාව", පුබුදු මුද්‍රණාලය, මාකොළ.

ශ්‍රී ලංකා මහ බැංකුව, (2013, 2014,2015), "වාර්ෂික වාර්තාව", ශ්‍රී ලංකා මහ බැංකුව, ගුණසේන මුද්‍රණාලය.

Abed, George, Liam P. Ebrill, Sanjeev Gupta, Benedict Clements, Ronald McMorran, Anthony Pellechio, Jerald Schiff, and Marijn Verhoeven, 1998, *Fiscal Reform in Low-Income Countries: Experience Under IMF-Supported Programs*, IMF Occasional Paper No. 160 (Washington: InternationalMonetaryFund).

Gupta, Sanjeev, Benedict Clements, and Edgardo Ruggiero, 1997, "Worldwide Military Expenditures Continue to fall (Anon., n.d.), But at a Slower Pace," *IMF Survey*, April 21, pp. 119-20.

Horie Shigeo, (1964), "International Monetary Fund, Macmillan and Co.Ltd, London.

International Monetary Fund, 1986, *Fund-Supported Programs, Fiscal Policy, and Income Distribution*, IMF Occasional Paper No. 46 (Washington: International Monetary Fund).